# මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 7 වන සභා වාරයේ
# 2025.08.12 වන දින පැවති 3වන මාසික මහා සභාවේ
# රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-

- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
- ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා
- ගරු මන්ත්‍රී ජී.ජී පාලිත කුමාර මහතා
- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා
- ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය
- ගරු මන්ත්‍රී නිශාන්ත නන්දකුමාර මුණසිංහ මහතා
- ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා
- ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා
- ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා
- ගරු මන්ත්‍රී ටී.එම්.ජගත් චමින්ද කුමාර මහතා
- ගරු මන්ත්‍රී යූ.ජී.දිමේන්ත්‍ර රංගනාත් මහතා
- ගරු මන්ත්‍රී ආර්.ජේ.ලයනල් මහතා
- ගරු මන්ත්‍රී හෂිත සුබෝදන මාරතුඩුවගේ මහතා
- ගරු මන්ත්‍රී පී.ජී.බසින්දාා පුෂ්පමාලි මිය
- ගරු මන්ත්‍රී සමල්ෂා උෂාදි විජේවික්‍රම මෙය
- ගරු මන්ත්‍රී දිල්කා හන්සිකා අබේසුන්දර මෙය
- ගරු මන්ත්‍රී ජේ.එල්.සුමිත් මහතා
- ගරු මන්ත්‍රී නිහාල් අබේවික්‍රමසිංහ මහතා

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2025 අගෝස්තු මස මාසික සභා රැස්වීම 2025.08.12 වන දින ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව 9.30ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ කරන ලදී.

## 01. පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

2025 ජූලි මස 08 දින පැවති මහා සභාවේ වාර්තාව සම්මත කිරීම.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා

2025.07.08 දින මහා සභා වාර්තාවේ යෝජනා අංක 5:3 යටතේ 5වන පිටුවේ ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතාගේ දෙවන කතාවේ සඳහන් **මේ පාරවල් සියල්ලම කාපට් කරපු පාරවල්** යන වාක්‍යය **මේ පාරවල් සියල්ලම කාපට් කරන්න තියන පාරවල්** ලෙස සංශෝධනය විය යුතුයි.

2025.08.12 දින මාසික මහා සභාවේදී 2025 ජූලි මස 08 දින පැවති මාසික මහා සභා වාර්තාව ඉහත සඳහන් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

## 02. සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන - නැත

## 03. සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම

- ආරච්චිගෙ,කටුවන්ගොඩ,මාලිම්බඩ,පාලටුව ලිපිනයේ පදිංචි එන්.ඩබ්.දිසානායක විසින් එවන ලද''දුංකොරටුව නම් වූ කටුවන්ගොඩ ඉඩම පිළිබඳවයි''යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- මාර්ග සංවර්ධන අධිකාරිය,විධායක ඉංජිනේරු කාර්යාලය,මැද්දවත්ත මගින් එවන ලද''කි.මී 1000 මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය''යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

- පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,මාතර මගින් එවන ලද''දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු තීරණ ක්‍රියාත්මක කිරීම 2025.06.13 දකුණු පළාත් පාසල්හි කපා ඉවත් කල යුතු අවධානම්ව පිහිටා ඇති ගස් පිළිබඳ වාර්තාවක් ලබා ගැනීම''යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>

- අතුරලිය ප්‍රාදේශීය සභාවෙන් කොඩි කණු GI බට නැවත ගෙන්වා ගැනීම සම්බන්ධවයි මැයෙන් ලිපියක් එවල තියනවා.එම් සඳහන් වන්නේ 2019.02.29 දින රැගෙන යනු ලැබූ GI බට 60න් GI බට 54ක් නැවත එම ආයතනයට ලැබී ඇති බවත් බට 6ක් මේ වන විටත් ලැබී නොමැති බවත් 2025.07.18 දින අතුරගිය ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභා රැස්වීමේදී එම GI බට සම්බන්ධව සාකච්ජා කළ බවත් නැවත ඒවා නිසි පරිදි ලබා නොදීම පිළිබදව දෝෂ දර්ශනයට ලක් වී ඇති බවත් 2025.08.05 දිනට පෙර එම කොඩි කණු නැවත ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනවා.මේක නීත්‍යානුකූලව ගෙන්වපු දෙයක් නෙවෙයි.හිටපු සභාපතිතුමාගේ හිතවත්කම් මත ගෙන්වපු දෙයක් ඒ නිසා හිටපු සභාපතිතුමාට ගෙවන ලෙස දන්වා යවමු.

- මාරගොඩ පූර්වාරාම විහාරයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ විසින් විහාරස්ථානයට විදුලිය සපයන රැහැන් පද්ධතිය පිවිසුම් මාර්ගය ඔස්සේ ලබා ගැනීම සඳහා මැයෙන් ලිපියක් එවලා තියනවා.එහි සඳහන් වන්නේ විහාරස්ථානයට විදුලිය සපයා ඇති විදුලි රැහැන් පද්ධතිය මාරගොඩ විනිප්‍රඩ් වතුයාය හරහා ලබා දී ඇති බවත් එම සැපයුම් පද්ධතිය මේ වන විට ඉතා අබලන් තත්වයට පත්ව ඇති බවත් විහාරයට පිවිසෙන ප්‍රධාන මාර්ගය ඔස්සේ විදුලි රැහැන් පද්ධතිය ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. මේක ලිපියක් මගින් විදුලි බල මණ්ඩලය දැනුවත් කරමු.

- දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය මගින් 2025 ජූලි 28 දින දකුණු පළාත් ආණ්ඩුකාරතුමා සමඟ පැවැත්වෙන සාකච්ඡාවේදී අවධානයට ලක් විය යුතු කරුණු මැයෙන් දකුණු පළාතේ ශාසනාරක්ෂක බල මණ්ඩල වල ලේඛකාධිකාරී හිමිවරුන් විසින් ඉරිදා දින උදය වරුවේ අමතර පන්ති පැවැත්වීම දහම්පාසල් පැවැත්වීම සඳහා මහත් බාධාවක් බවත් එම නිසා ඉරිදා උදයවරුවේ අමතර පන්ති පැවැත්වීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වලට යෝජනාවක් ඉදිරිපත් කර එම තීරණය අනුව හා ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි කටයුතු කරන ලෙස දන්වා ඇති ලිපිය සභාගත කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය</u>

- මාර/අල්හුදා මුස්ලිම් විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් පාසලට පිවිසෙන මාර්ගය හා එහි අනතුරුදායක භාවය පිළිබඳ දන්වා ලිපියක්එවල තියනවා සභාපතිතුමණි, ඔබතුමා කිහිපවරක් එම පාසලට පැමිණිල තියනවා එහි ත්‍රීවිල් එකක්වත් යන්න බැරි තත්වයක් තියනවා. පල්ලියත්, මුස්ලිම් ගම්මානයත්, පාසලත් කියන ස්ථාන 3 නට සම්බන්ධ වන ස්ථානයක්. පාරේ ආරම්භක ස්ථානයේ ඉඳලම යන්න බැහැ ඒවගේම පාසල ඉදිරිපිට වංගුව ඉතාම අනතුරුදායකයි. එහි නීතිමය තත්වය මම

දන්නෑ පුලුවන්නම් දෙපැත්තෙන්ම මාර්ග බාධක වැටි දෙකක් දාලා ගමනාගමනය අඩාල කරල දෙන්න කියලා විදුහල්පතිතුමා ඉල්ලීමක් කරල තියනවා.

**ගරු මන්ත්‍රී ජී.ජී පාලිත කුමාර මහතා**

- සභාපතිතුමණි මේ ලිපිය ඉදිරිපත් කරන්නේ ආර්ථික සංවර්ධන නිලධාරී, ග්‍රාම නිලධාරී, සමෘද්ධි නිලධාරී, ප්‍රජා මන්ඩලය වෙනුවෙන් ගල් ඇන්ද කුට්ටිය ප්‍රජා ශාලාවට ආසන්නයේ අඩි 10 ක දුරින් උස අඩි 20 සිට 50 දක්වා උස් අනතුරුදායක ගස් ඉවත් කර දෙන ලෙසත් ඉල්ලා සිටිනවා. මෙහි අවශ්‍ය විදුලිය මා විසින් පුද්ගලික වියදමින් ලබා දුන්නා එහි මේ වන විට පහල මාලයේ විදුලි බල්බ එකක්වත් දැල් වෙන්නෙ නෑ. ඒ අවශ්‍ය විදුලි බල්බ ප්‍රමාණය ලබා දෙන ලෙසත් ඉල්ලා සිටිනවා. එමෙන්ම සභාපතිතුමණි මෙහි වැසිකිලි දෙකක් ජල උපාංග සහිතව පෞද්ගලිකව මා විසින් ලබා දුන්නා. එහි රාජ්‍ය නිලදාරීන් තුන්දෙනෙක් සේවය කරනවා ඒ නිසා ජලය ලබා ගැනීමට අවශ්‍ය උපාංග ලබා දෙන ලෙසත් ඉල්ලා සිටිනවා. ඒවගේම මේ ප්‍රජා ශාලාවේ ඉවුර වරින් වර කඩා වැටෙන තත්වයක් තියනවා. පසුගිය කාලයේ කම්කරුමහතුන් ලවා එය පිරිසිදු කිරීම් සිදු කළා නැවතත් එම තත්වයට පත්වෙලා තියනවා එම කොටස ඉවත් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා**

- කිරිමැටිමුල්ල, මාතර, අකුරැස්ස ප්‍රධාන මාර්ගයේ අතුරු මාර්ගයක් වන හිල්සයිඩ් ලේන් මාවත ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම මැයෙන් ලිපියක් ඉදිරිපත් කරලා තියනවා. සභාපතිතුමනි කිරිමැටිමුල්ල දකුණ මාතර අකුරැස්ස ප්‍රධාන මාර්ගයේ අතුරු මාර්ගයක් වන හිල්සයිඩ් ලේන් මාවත පුද්ගලික පාරක් ලෙස පවුල් 20 පමණ ඍජුව ප්‍රයෝජනයට ගන්නා මාර්ගයක් මෙහි ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන දෙකක් පශු වෛද්‍ය මධ්‍යස්ථාන දෙකක් හා ෂැම්පු හා ආශ්‍රිත නිෂ්පාදන ආයතනයක් පිහිටා තියනවා ඒ වගේම මේ මාර්ගය හරහා තල්ගහ පෙදෙස මාර්ගයට සම්බන්ධ වන දිනපතා විශාල පිරිසක් වක්‍රව භාවිතා කිරීම හේතුවෙන් පොදු මාර්ගයක් ලෙස ප්‍රාදේශීය සභාවට පවරා ගෙන සංවර්ධනය කර දෙන ලෙසට එහි පදිංචිකරුවන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා**

- තෙලිජ්ජවිල පුස්තකාලයේ උපදේශන කමිටුව මඟින් පුස්තකාල සංවර්ධනය සඳහා සිදු කරනු ලබන යෝජනා මහා සභාවට ඉදිරිපත් කරන මැයෙන් ලිපියක් තියනවා එහිදී

01.පුස්තකාලය සඳහා පොත් රාක්ක මිලදී ගැනීම හෝ සකස් කිරීම.
02.පුස්තකාලය සඳහා අලුතින් පොත් මිලදී ගැනීම.
03.ළමා පුස්තකාල අංශය සඳහා විදුලි පංකා දෙකක් මිලදී ගෙන සවි කිරීම.
04.පුස්තකාලයේ භූමිය පිරිසිදු කොට අබිලි ද්‍රව්‍ය ඉවත් කිරීම.
05.පුස්තකාලයේ ළමා අංශය තීන්ත ආලේප කොට චිත්‍ර ඇඳීම.
06.පුස්තකාලය ලී බඩු අලුත්වැඩියා කිරීම.
07.පුස්තකාලය සඳහා පරිගණකයක් මිලදී ගැනීම.
08.පුස්තකාල මෘදුකාංග ලබා ගැනීම සහ ඒ සඳහා පුහුණුවක් ලබා ගැනීමට පුස්තකාලයාධිපති යොමු කිරීම.
09.පුස්තකාලය සඳහා පොත් කවුන්ටරයක් මිලදී ගැනීම.

ආදී ඉල්ලීම් සිදු කර තිබෙනවා

**04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත.**

## 05. යථා පරිදි කල්දී ඇති යෝජනා

**<u>යෝජනා අංක 5:1</u>**

2025.07.04 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා

ඒ අනුව 2025.07.04 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:2</u>**

2025.07.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා

ඒ අනුව 2025.07.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:3</u>**

2025.07.25 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ටී.එම්.ජගත් චමින්ද කුමාර මහතා

ඒ අනුව 2025.07.25 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:4</u>**

2025.07.14 දින පැවති කාර්මික සේවා කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී නිශාන්ත නන්දකුමාර මුණසිංහ මහතා

ඒ අනුව 2025.07.14 දින පැවති කාර්මික සේවා කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

යෝජනා අංක 5:5 ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා විසින් ඉල්ලා අස් කරගන්නා ලදී.

**<u>යෝජනා අංක 5:6</u>**

2025.07.14 දින පැවති පරිසර හා පහසුකම් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

ඒ අනුව 2025.07.14 දින පැවති පරිසර හා පහසුකම් කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:7</u>**
2025.07.28 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී යූ.ජී.දිමේන්ත්‍ර රංගනාත් මහතා

ඒ අනුව 2025.07.28 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:8</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සඳහා ට්‍රැක්ටර් රථ රියදුරකු තාවකාලික/දෛනික පදනමින් බඳවා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.ජී පාලිත කුමාර මහතා

**<u>ගරු මන්ත්‍රී ජී.ජී පාලිත කුමාර මහතා</u>**
සභාපතිතුමනි,කාඩර් එකේ නැත්තම් කාඩර් එකට ඇතුළත් කරගෙන හරි මේ යෝජනාව ක්‍රියාත්මක වෙනවා නම් හොදයි.අපේ ප්‍රදේශයේ කසල පිළිබඳ විශාල ගැටලුවක් තියනවා.විශාල ඉඩම් කුඩා ඉඩම් බවට පත්වෙලා තියනවා.වෛබීනියාවත්ත,අකුරුගොඩ රෝස්වුඩ්,අකුරුගොඩ පරණවත්තහේන යන ප්‍රදේශ වල උග්‍ර ප්‍රශ්නයක් බවට පත්වෙලා තියනවා.අප සභාව සතු ප්‍රයෝජනයට ගත හැකි ට්‍රැක්ටර් හා ටේලර් 3ක් තියනවා.ඒවාට ගන්නා ක්‍රියාමාර්ග හා සභා ධාරිතාව වැඩි කිරීමේදී වන් කියුබ් පොඩි ටිපර් එකක් ගන්න පුළුවන්නම් පොඩි පාරවල් වල ගොඩක් කසල එකතු කරගන්න පුළුවන්.

ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සඳහා ට්‍රැක්ටර් රථ රියදුරකු තාවකාලික/දෛනික පදනමින් බඳවා ගැනීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:9</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත සඳහන් මාර්ග ගමන් කිරීමට ඉතා අපහසු තත්වයේ පවතින බැවින් ප්‍රමුඛතාවය ලබා දී ඒවා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

- කුරුන්ද පන්සල පාර
- තුඩැල්ලවත්ත අතුරු පාර
- ලණුගොඩ පතිරණගෙවත්ත පාර (ඉවත් කරන ලද කැටගල් යොදා)
- පාතේගම ගල්ගෙඩිය අසලින් යන පාර
- කඩුකන්න හොරගොඩ මාර්ගයේ සිට එගොඩහවත්ත මාර්ගය
- වල්පිට තල්ගස් අද්දර මාර්ගය

- බතලපිට්ටනිය චරිත් මහතාගේ නිවස අසල සිට ජේ.වී.ප්‍රියන්ත මහතාගේ නිවස දක්වා මාර්ගය ආදම්වත්ත ඉහල කොටසේ සඳරුවන් සර්විස් ස්ථානයේ සිට ආශා මහත්මියගේ නිවස දක්වා මාර්ගය
- සුල්තානාගොඩ කැකිල්ල මාර්ගය
- සුල්තානාගොඩ දකුණ දිග්ගස්ගොඩ වෙරිගෙවත්ත මාර්ගය
- ජී.ගුණවික්‍රම මාවත ටී.කේ.ගාමිණී මාවතට සම්බන්ධ කිරීම
- මාලිම්බඩ කැනිල්මෝ ගාර්ඩ්න් මාර්ගය
- උඩවත්ත අසල සිට ගමගෙදර දක්වා මාර්ගය (බිබුලකඩේ සිට නාගස දක්වා)
- ඇල්ගිරිය කටුවලමුල්ල මාර්ගය
- ජයලත්වත්ත වඩුගෙදර මාර්ගය
- ශාන්තිවත්ත මැද පාර(වටරවුම් පාර)
- අකුරුගොඩ උතුර ග්‍රාම නිලධාරී වසමේ ගල්ඇන්දකුට්ටිය කටුවමුල්ල වැව අසලින් ආරම්භ වන අතුරු මාර්ගය
- හන්නගල පියද්දෙගොඩ මාර්ගය
- පන්ගොඩ මුලුපැල්ල මාර්ගයේ බෝක්කුව හා පැති බැම්ම ඇතුළුව මාර්ගයේ කොටසක්
- සපුමල් මාවත හා සදහම් මාවත සම්බන්ධ වන අතුරු මාර්ගය
- අධිකාරිවිලගම ප්‍රජා ශාලා පිවිසුම් මාර්ගය අසල සිට ලලිත් මහතාගේ වෙල අසල දක්වා මාර්ගය
- කැකුණවෙල බෙරුවෙල මාර්ගයේ මහගොඩවත්ත පාර සංවර්ධනය
- කැකුණවෙල සේවා පියස අසලින් ආරම්භ වී බෙලිගහගෙදර හරහා දිවෙලගොඩ දක්වා මාර්ගය
- හොරගොඩ අතුරු මාර්ගය 1
- හොරගොඩ අතුරු මාර්ගය 11

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

**<u>ඉහත අංක 5:9 යෝජනාව ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා විසින් පහත පරිදි සංශෝධනය කරන ලදී.</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත සඳහන් මාර්ග ගමන් කිරීමට ඉතා අපහසු තත්වයේ පවතින බැවින් ප්‍රමුඛතාවය ලබා දී ඒවා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

- කුරුන්ද පන්සල පාර
- වල්පිට තුඩැල්ලවත්ත අතුරු පාර
- ලුණුගොඩ කුරුන්දෙගෙදර දක්වා පාර (ඉවත් කරන ලද කැටගල් යොදා)
- පාතේගම ගල්ගෙඩිය අසලින් යන පොකුණුමුල්ල පාර
- කඩුකන්න හොරගොඩ මාර්ගයේ සිට එගොඩහවත්ත මාර්ගය(ලුණුගොඩ ජගත් මහතාගේ නිවස අසලින් ආරම්භ වෙලා බේකරිය අසලින් අවසන් වන මාර්ගය)
- වල්පිට තල්ගස් අද්දර මාර්ගය(ලොකු මහත්තයාගේ නිවස අසලින් ඉදිරියට)
- බතලපිට්ටනිය චරිත් මහතාගේ නිවස අසල සිට ජේ.වී.ප්‍රියන්ත මහතාගේ නිවස දක්වා මාර්ගය
- ආදම්වත්ත ඉහල කොටසේ සඳරුවන් සර්විස් ස්ථානයේ සිට ආශා මහත්මියගේ නිවස දක්වා මාර්ගය
- සුල්තානාගොඩ කැකිල්ල මාර්ගය (උනැල්ල පැත්තෙන් )
- සුල්තානාගොඩ දකුණ දිග්ගස්ගොඩ වෙරිගෙවත්ත මාර්ගය
- ජී.ගුණවික්‍රම මාවත ටී.කේ.ගාමිණී මාවතට සම්බන්ධ කිරීම
- ඇල්ගිරිය උඩවත්ත අසල සිට ගමගෙදර දක්වා මාර්ගය (බිබුලකඩේ සිට නාගස දක්වා)
- ඇල්ගිරිය කටුවලමුල්ල මාර්ගය
- ජයලත්වත්ත වඩුගෙදර මාර්ගය (අධිවේගී මාර්ගයේ බෝක්කුව අසලින් අවසන් වන මාර්ගය)
- ශාන්තිවත්ත මැද පාර(වටරවුම් පාර)

- අකුරුගොඩ උතුර ග්‍රාම නිලධාරී වසමේ ගල්ඇන්දකුට්ටිය රදවමුල්ල වැව අසලින් ආරම්භ වන අතුරු මාර්ගය
- හන්නගල පියද්දෙගොඩ මාර්ගය
- පන්ගොඩ මුලුපැල්ල මාර්ගයේ බෝක්කුව හා පැති බැම්ම ඇතුළුව මාර්ගයේ කොටසක්
- සපුමල් මාවත හා සඳහම් මාවත සම්බන්ධ වන අතුරු මාර්ගය
- අධිකාරිවිලගම ප්‍රජා ශාලා පිවිසුම් මාර්ගය අසල සිට ලලිත් මහතාගේ නිවස අසල දක්වා මාර්ගය
- කැකුණවෙල බෙරුවෙල මාර්ගයේ මහගොඩවත්ත පාර සංවර්ධනය
- කැකුණවෙල සේවා පියස අසලින් ආරම්භ වී මානිගෙවත්ත දක්වා මාර්ගය
- දම්පැල්ල පරාටියවල අසලින් ආරම්භ වී බෙලිගහගෙදර හරහා දිවෙලගොඩ දක්වා මාර්ගය
- නාපෙ 1 දිවෙල්වත්ත පාර
- රුප්පගොඩ පාර ගොඩගම ගෙදර දක්වා සංවර්ධනය කිරීම
- වෙනිඅකුල බුදු මැදුර අසලින් ආරම්භ වන ප්‍රගති මාවතේ රසික මහතාගේ නිවස අසලින් පැති බැම්මක් ඉදිකර මෝදරගෙවත්ත නිවස දක්වා කැටගල් අල්ලා සංවර්ධනය කිරිම
- හොරගොඩ ලිබර්ටි ටෙරස් අතුරු මාර්ගය සල්ගස අසල සිට ප්‍රියන්ත මහතාගේ නිවස දක්වා

ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉහත සඳහන් මාර්ග ගමන් කිරීමට ඉතා අපහසු තත්වයේ පවතින බැවින් ප්‍රමුඛතාවය ලබා දී ඒවා සංවර්ධනය කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:10</u>**

ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය සඳහා ශබ්ද විකාශන පද්ධතියක් සවි කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය

**<u>ගරු මන්ත්‍රී ජී.ජී පාලිත කුමාර මහතා</u>**

මේ යෝජනාව ඉක්මනින් ඉෂ්ඨ කරගන්න පුලුවන්නම් වටිනවා මුදල් කමිටුව මඟින් අනුමත කරන ලද ප්‍රජා සංවර්ධන අංශය මඟින් සංවිධානය කරන වැඩසටහන් 03 ක් සඳහා 120,000.00 ක මුදලක් ශබ්ද විකාශන සඳහා වැය වෙනවා.මේ යෝජනාව ඉක්මනින් කරගන්න පුලුවන්නම් ලොකු මුදලක් ඉතිර කරගන්න පුලුවන් ශ්‍රවනාගාරය බදුදීමේදී ඒ වැඩසටහන් කරන අයත් ශබ්ද විකාශන වෙනුවෙන් ලොකු මුදලක් වියදම් කරනවා.මේ යෝජනාව ඉක්මනින් ඉටු කර ගන්න පුළුවන්නම් ශ්‍රවනාගාරය බදු දීමේදී අයකරන මුදල වැඩි කරන්නත් පුලුවන්වේවි.

ඒ අනුව ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය සඳහා ශබ්ද විකාශන පද්ධතියක් සවි කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:11</u>**

2025.07.15 වන දින පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ජා කරන ලද වෛබීනියාවත්ත ඉඩම් කොටස් 02 සඳහා හිමිකම් ඔප්පුවක් නොමැති වීම හේතුවෙන් ඉඩම් කොටස් 02 සඳහා එක ප්‍රකාශන ඔප්පුවක් සකස් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.ජී පාලිත කුමාර මහතා

ඒ අනුව වෛබීනියාවත්ත ඉඩම් කොටස් 02 සඳහා හිමිකම් ඔප්පුවක් නොමැති වීම හේතුවෙන් ඉඩම් කොටස් 02 සඳහා එක ප්‍රකාශන ඔප්පුවක් සකස් කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 5:12</u>**

2026 වර්ෂය සඳහා වරිපනම් බදු,ව්‍යාපාර බදු ඇතුළත් බදු අය කිරීමේ වාර්ෂික ගැසට් නිවේදනය අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී යූ.ජී.දිමේන්ද්‍ර රංගනාත් මහතා

මහා සභාව කාරක සභාව බවට පත් කිරීම.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ජී.ජී පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

කාරක සභාව මහා සභාවක් බවට පත් කිරීම.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ජී.ජී පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

ඒ අනුව 2026 වර්ෂය සඳහා වරිපනම් බදු,ව්‍යාපාර බදු ඇතුළත් බදු අය කිරීමේ වාර්ෂික ගැසට් නිවේදනය අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 5:13</u>**

2025.07.15 වන දින පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටුව විසින් දන්වා සිටි පරිදි මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු පහත ගොඩනැගිලි වල පවත්වා ගෙන යනු ලබන පෙර පාසල් හා රාජ්‍ය කාර්යාල වලින් සුදුසු පරිදි ගාස්තු අය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

- කිරිමැටිමුල්ල ශ්‍රී වර්ධනාරාමය අසල ප්‍රජා ශාලාව- මිහිඳු පෙර පාසල හා සේවා පියස
- හොරගොඩ පරවෙනියවත්ත ප්‍රජා ශාලාව - පෙර පාසල හා සේවා පියස
- භාග්‍යගම ප්‍රජා ශාලාව - දර්ශන පෙර පාසල
- ගල්පමුණ හාලිඇල ප්‍රජා ශාලාව - සේවා පියස
- උනින්දුවෙල ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථානය
- සුල්තානාගොඩ දිග්ගහගොඩවත්ත - සෞඛ්‍ය මධ්‍යස්ථානය
- කහටගහහේන ඉඩම - සේවා පියස
- කඩුකන්න බෝ ගහ අසල - සේවා පියස

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී නිශාන්ත නන්දකුමාර මුණසිංහ මහතා

**<u>ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා</u>**

සභාපතිතුමණි, හොරගොඩ පරවෙනියවත්ත ප්‍රජා ශාලාව පෙරපාසල හා සේවා පියස කියන ගෙඩනැගිල්ල සහිත භූමිය හොරගොඩ ශ්‍රී වර්ධනාරාමය විහාරස්ථානය සතු භූමියක් ඒක සහා අරමුදලින් ඔප්පුව ලියලා ඔප්පු ගාස්තුව හා ප්ලෑන් එක සහා මුදලින් කරලා පර්චස් 10 ක භූමිය ඔප්පුවකින් සභාවට පවරනවා දැනට සේවා පියසක් පවතින කොටස ස්ලැබ් එක දාලා බිත්ති බැදලා තිබුණු එකම ගොඩනැගිල්ල වසර පහකට

පමණ පෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් අර ස්ලැබ් එක දාපු කොටසේ උඩ කාමර දෙකක් පමණක් හදාගෙන එතන නිලධාරි 4 දෙනා රාජකාරි කරනවා සේවා පියසක් පවට පත් කරගෙන.ප්ලෑන් දෙකක් නෙවෙයි එකම ප්ලෑන් එකකට හදපු ගොඩනැගිල්ල.ප්‍රජා ශාලාවට විදුලිය ලබා ගන්න ප්‍රතිපාදන වෙන් කරනවා වීරසුමන මැතිතුමා.ඒත් වයිරින් කරලා විදුලිය ලබාගන්න බැරිවුණා.පසුව මගේ පුද්ගලික වියදමින් විදුලිය ලබාගන්න මැදිහත්වෙනවා.ඒ අවස්ථාවෙදී එකම ගොඩනැගිල්ල නිසා අර නිලධාරීන් 4දෙනාටත් මං බිල ගෙවාගන්න සම්බන්ධ වෙන්න කියලා කිව්වා.ඒ අවස්ථාවේ කැමැත්ත ප්‍රකාශ කළත් පසුව අකමැති වුනා.ඊට මාස 6කට පමණ පසු සේවා පියස තියන කොටසට නැවත විදුලිය අරගෙන තියනවා.රජයේ මුදල් වලින්.සභාව සතු භූමියකට ගොඩනැගිල්ලකට එහෙම ලයිට් ගන්න හැකියාවක් නෑ.මගේ පුද්ගලික මුදල් වුනත් සභාවේ නමට තමයි මං විදුලිය ගත්තේ.අර නිලධාරීන් විදුලිය වාගේම ජලයත් අරන් තියනවා.ප්‍රජා ජල ව්‍යාපෘතියෙනුත් අපි ජලය දීලා තියනවා.දැන් සභාවේ අනන්‍යතාවයක් නැති ගොඩනැගිල්ලක් බවට පත්වෙලා.විදුලිය ලබා ගැනීම සම්බන්ධව සභාව දැනුවත්ද කියලා අහන්න කැමතියි.විදුලි පද්ධති දෙකක් එකම ගොඩනැගිල්ලක තිබීම ජාතික අපරාධයක්.ඒ නිසා මේ පිළිබඳව අවධානය යොමු කරලා ඒ අදාළ නිලධාරීන්ගෙන් මුදල් අයකරගැනීම සුදුසු බවත් මා ප්‍රකාශ කරනවා.

**<u>ගරු මන්ත්‍රී ජී.ජී පාලිත කුමාර මහතා</u>**

සභාපතිතුමනි,මේ යෝජනාව මෙතෙක් කල් සිදු වුනු දෙයක් නෙවෙයි.මෙතන තියනවා උනින්දුවෙල ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථානය.95 තමයි මේක සෞඛ්‍ය එකට දෙන්නෙ.අවුරුදු 30කට පස්සෙ මේ වගේ යෝජනාවක් එන්නෙ කොහොමද කියලා දැනගන්න කැමතියි.මේ විදියට බලද්දි තෙලිජ්ජවිල ඉඩමත්,හොරගොඩ ලිබර්ටි ටෙරන්ස් ඉඩමත්,අකුරුගොඩ ඉඩමත් අපේ.අපේ ඉඩම්වල තමයි සේවා පියසවල් හැදුවේ.ඒ ඉඩම් වල අයිතිය පිළිබඳවත් සොයාගන්න වෙයි.අකුරුගොඩ නැටැව්වෙ අංක 68 කැබැල්ල අපිට දෙනවා හැබැයි එහි කිසිදු අයිතියක් අපිට නෑ.අකුරුගොඩ ශාන්තිවත්තේ පොදු කැලි 2යි අපිට තියෙන්නේ නමුත් 4ක් තිබුණා.2ක් නිහාල් කියන මහත්තයා ඉඩම් 2ක් විකුණගත්තා.අපේ ඉඩම් කැලෑවට යන්න දෙන්නෙ නැතුව කාට හරි දීලා කියක් හරි ආදායම ගන්න පුළුවන් නම් හොඳයි.මේ ඉඩම් වල තත්වය පිළිබඳ කරුණාකර ඊළඟ සභාවට දන්වන්න.

ඒ අනුව රාජ්‍ය නිලධාරීන් සේවා ස්ථානය කරගෙන සිටී නම් ඔවුන් විසින් ජල විදුලි බිල්පත් ගෙවීමටත් එසේ නොමැති ස්ථාන වලින් මාසයකට රු.200.00ක් අය කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:14</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ සේවය කරන විදුලි කාර්මික මහතාගේ රක්ෂණ කාල සීමාව අගෝස්තු මාසයෙන් කල්පිරෙන බැවින් 2025/2026 වර්ෂය සඳහා අදාළ රක්ෂණය සිදු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ සේවය කරන විදුලි කාර්මික මහතාගේ රක්ෂණ කාල සීමාව අගෝස්තු මාසයෙන් කල්පිරෙන බැවින් 2025/2026 වර්ෂය සඳහා අදාළ රක්ෂණය සිදු කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:15</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරුවෙකු ලෙස සේවය කළ එම්.එස්.ඉන්ද්‍රපාල මහතා 2025.07.04 දින විශ්‍රාම යාම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා ස්ථිර පදනමින් සෞඛ්‍ය කම්කරුවෙකු බඳවා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා

ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරුවෙකු ලෙස සේවය කළ එම්.එස්.ඉන්ද්‍රපාල මහතා 2025.07.04 දින විශ්‍රාම යාම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා ස්ථිර පදනමින් සෞඛ්‍ය කම්කරුවෙකු බඳවා ගැනීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:16</u>**

ප්‍රාදේශීය සභාවට අයත් ඕගස්පේ පොදු සුසාන භූමිය පිවිසුම් මාර්ගයේ සිටම සුසාන භූමියට අයත් මුළු වපසරියම අධික ලෙස වල් බිහිවී ඇත.මෙම වල් බිහිවී ඇති සම්පූර්ණ භූමියම එළි පෙහෙළි කර මායිම් හදුනාගෙන ආරක්ෂක වැටක් ඉදිකිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.ජී පාලිත කුමාර මහතා

**<u>ගරු මන්ත්‍රී ජී.ජී පාලිත කුමාර මහතා</u>**

සභාපතිතුමණි, උප සභාපතිතුමාගේ යෝජනාව ඉතාම හොද යෝජනාවක්. ඒ වගේම අපිට තියන සුසාන භූමි වල අපේ බල ප්‍රදේශයෙන් පිටත යම් දේහයක් ආදාහනය කිරීමේ හැකියාව තියනවද කියලා දැනගන්න කැමතියි. වර්තමාන ආණ්ඩුකාරතුමා චක්‍රලේඛයක් නිකුත් කරනවා එයට අනුව මාතර රෝහලේ මනුස්සයෙක් මැරුණත් මාතර නගර සභාවේ භූමදානය කරන්න බෑ. මෙතුවක් කල් එහෙම තිබුනෙ නෑ. දේහය භාරගන්න කෙනෙක් නැත්නම් මාතර නගර සභා බල ප්‍රදේශයේ තමයි භූමදානය කළේ. මේක එන්නෙ නුවර පැත්තෙ දරුවෙක් භූමදානය කලාම නීතියක් ලෙස සම්මත වෙනවා. නීතිය තුළ ලොකු අසාධාරණයක් වෙනවා. පසුගිය දවසේ මාතර අම්මා කෙනෙක් අනුරාධපුරේදි මැරුණා එහේ භූමදානය කරන්න බෑ අපට දේහය ගේන්න සිදුවුනා.වැලිගම සභාවේ සෑම සුසාන භූමියකටම ගියා අවසර ලැබුනෙ නෑ. ඡන්දහිමි නාම ලේඛනයේ නම නෑ කියලා. මේ නීතිය හුඟදෙනෙක් දන්නෙ නෑ නමුත් දැනට ක්‍රියාත්මකයි. ඔබතුමා සභාපති සම්මේලනය හා දිස්ත්‍රික් සම්මේලනයේදී මේ ගැන කතා කරන්න.ඕනෑම මරණයක් සුසාන භූමිය තුළ ආදාහනය කරන්න අවසර තියනවා.නමුත් භූමදානය කරන්න බෑ.යම් මරණයක් උසාවි නියෝගයකින් භූමදානය කරන්න ඕන වුනොත් සභාවේ සුසාන භූමි පාලකයෙක් ඉන්න ඕන. ඔහු දැනගෙන ඉන්න ඕන මේ දේහය කොතනද භූමදානය කරල තියෙන්නෙ කියන කාරණාව. ඒ කියන්නෙ මිනී වළවල් අංකකරණයක් සිදු කර සභාවේ පොතක් පවත්වාගෙන යා යුතුයි.

ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් ඕගස්පේ පොදු සුසාන භූමිය පිවිසුම් මාර්ගයේ සිටම සුසාන භූමියට අයත් මුළු වපසරියම අධික ලෙස වල් බිහිවී ඇත.මෙම වල් බිහිවී ඇති සම්පූර්ණ භූමියම එළි පෙහෙළි කර මායිම් හදුනාගෙන ආරක්ෂක වැටක් ඉදිකිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:17</u>**

ප්‍රාදේශීය සභාවට අයත් දෙමහල් කඩ කාමර සහිත වෙළඳ සංකීර්ණයට උඩු මහලට පිවිසීම සඳහා දැනට ඇත්තේ පඩිපෙලකි.උඩු මහලේ ඇති වෙළඳ කුටි වල ව්‍යාපාර කටයුතු වර්ධනය කිරීම සඳහා ජනතාවට පහසුවෙන් ගමන් කිරීමට මාලිම්බඩ මංසන්ධියේ කද්දුව පැත්තට මුහුණලා ඇති බස් හෝල්ට් එක ආසන්නයේ ඉහළ මාලයට G I බට හා ඇලුමිනියම් භාවිතයෙන් පඩි පෙළක් ඉදි කිරීමට සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

**<u>ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා</u>**

සභාපතිතුමණි, ඔබතුමා සමඟ ක්ෂේත්‍ර චාරිකාවේ දී වෙළඳ මහතුන් සිදු කළ ඉල්ලීමක් ඒ ඉල්ලීම නිවැරදි බව පෙනී ගිය නිසත් මේ යෝජනාව කරන්නේ කඹුරුපිටිය පැත්තට යන බස් හෝල්ට් එක ආසන්නයේ ජී.අයි බට යොදා පඩි පෙලක් සකස් කිරීම කාටත් පහසුවක් කල්පවතිනවා වගේම වියදමත් අඩුයි. පාරිභෝගිකයන් විශාල ප්‍රමාණයක් උඩුමහලට ගෙන්වා ගැනීම තමයි අපේක්ෂාව ඒ සඳහා මෙය විශාල පහසුවක් වෙනවා.

ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් දෙමහල් කඩ කාමර සහිත වෙළඳ සංකීර්ණයට උඩු මහලට පිවිසීම සඳහා දැනට ඇත්තේ පඩිපෙලකි.උඩු මහලේ ඇති වෙළඳ කුටි වල ව්‍යාපාර කටයුතු වර්ධනය කිරීම සඳහා ජනතාවට පහසුවෙන් ගමන කිරීමට මාලිම්බඩ මංසන්ධියේ කද්දුව පැත්තට මුහුණලා ඇති බස් හෝල්ට් එක ආසන්නයේ ඉහළ මාලයට G I බට හා ඇලුමිනියම් භාවිතයෙන් පඩි පෙළක් ඉදිකිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:18</u>**

මාලිම්බඩ කද්දුව පාර සෙන්ට්‍රල් පාර්ක් පිවිසුම් මාර්ගයේ මීටර් 150ක් පමණ දුරින් ගලා බසින දොළට බැසීම සඳහා ඉතාමත් දුෂ්කර අඩිපාරක් පවතී.මෙම අඩිපාර කොන්ක්‍රීට් පඩි සකසා අත්වැට G I බට යොදා සකස් කිරීම සඳහා මූලික අමුද්‍රව්‍ය පමණක් අවශ්‍ය වේ.ඉතිරි සියලුම ඉදි කිරීම් ශ්‍රම දායකත්වය මඟින් සිදු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.ජී පාලිත කුමාර මහතා

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**

මන්ත්‍රීවරුණි,සභාවට ආදායම් උත්පාදන ක්‍රමයක් ලෙස දොළ සංවර්ධනය කරලා ස්වාභාවික නාන තටාකයක් ඉදිකරලා කබානා කිහිපයක් සකස් කරන්න යෝජනා වෙලා තියනවා.ඒ නිසා මේ යෝජනාව අවශ්‍ය නෑ කියලා මා ප්‍රකාශ කරනවා.

ඒ අනුව මාලිම්බඩ කද්දුව පාර සෙන්ට්‍රල් පාර්ක් පිවිසුම් මාර්ගයේ මීටර් 150ක් පමණ දුරින් ගලා බසින දොළට බැසීම සඳහා ඉතාමත් දුෂ්කර අඩිපාරක් පවතී.මෙම අඩිපාර කොන්ක්‍රීට් පඩි සකසා අත්වැට G I බට යොදා සකස් කිරීම සඳහා මූලික අමුද්‍රව්‍ය පමණක් අවශ්‍ය වේ.ඉතිරි සියලුම ඉදි කිරීම් ශ්‍රම දායකත්වය මඟින් සිදු කිරීමේ යෝජනාව ක්‍රියාත්මක නොකිරීමට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 5:19**

මාලිම්බඩ නගරයේ අනතුරු වැලැක්වීම සඳහා හා නගර අලංකාර කිරීම සඳහා අලංකාරවත් වටරවුමක් ඉදි කර ජනතාවගේ දැනගැනීම පහසු කරලීම සඳහා නාමකරණය කර නාම පුවරු ප්‍රදර්ශනය කිරීමට සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.ජී පාලිත කුමාර මහතා

**ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා**

සභාපතිතුමණි, දැනට තියන වටරවුම මම හිතන්නෙ ත්‍රීරෝද රථ සංගමයෙන් තමයි ඉදිකරල තියෙන්නෙ. ඔවුන්ට ඒ පිළිබඳව ස්තූතිවන්ත වෙනවා.මං අදහස් කලේ ලොකු මුදලක් වියදම් නොකර නගරයට එන අයෙකුට පැහැදිලිව මාර්ග හඳුනා ගැනීමට හැකි පරිදි නාමකරණය කර අලංකාරවත්ව සකස් කරමු කියන කාරණාව.අනුග්‍රාහකයෙක් සමඟ කතා කරල ආසන්න නගරයට ඇති කිලෝ මීටර් ගාන දාලා පිට පලාතකින් හෝ රාත්‍රී ගමන් කරන කෙනෙකුට පහසුවෙන් හදුනාගන්න පුලුවන් ආකාරයට සකස් කිරීම ඉතා ප්‍රයෝජනවත් වෙනවා.ඒ මඟින් අනතුරු වලක්වා ගන්නත් පුලුවන්.

**ගරු මන්ත්‍රී ජී.ජී පාලිත කුමාර මහතා**

සභාපතිතුමණි,RDA එකෙන් අවසර අරගෙන කන්න පුලුවන්නම් හොදයි.මොකද වැල්ලතොටයි කඹුරුපිටියයි අතරමන්වෙලා මිනිස්සු මහට ගිහින් ආපස්සට එනවා.RDA නිලධාරීන් පවා දන්නෙ නැතුව ඇති ඉස්සර එහෙම එකක් තිබුණ කියලා.අපේ කුඩා කාලයේ නම් තිබුණා නාමකරණයක් කරලා.ආසන්න නගර වලට ඇති දුර සඳහන් කරලා ප්‍රදර්ශනය කරන්න පුළුවන් නම් හොදයි.

ඒ අනුව මාලිම්බඩ නගරයේ අනතුරු වැලැක්වීම සඳහා හා නගර අලංකාර කිරීම සඳහා අලංකාරවත් වටරවුමක් ඉදි කර ජනතාවගේ දැනගැනීම පහසු කරලීම සඳහා නාමකරණය කර නාම පුවරු ප්‍රදර්ශනය කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 5:20**

තෙලිජ්ජවිල රාජකීය විද්‍යාලය අසලින් ආරම්භ වී හොරගොඩ නාපෙ හරහා මුස්ලිම් ගම්මානයට සම්බන්ධ විය හැකි මාර්ගයේ සංවර්ධනය කිරීමට ඉතිරිව ඇති මීටර් 102 ක කොටස සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

**ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය**

සභාපතිතුමනි,මං මේ ඉදිරිපත් කරන මාර්ගය තෙලිජ්ජවිල රාජකීය විද්‍යාලය අසලින් ආරම්භ වෙලා හොරගොඩ නාපෙ ගම මැදින් ගිහින් මුස්ලිම් ගම්මානය සම්බන්ධ වන මාර්ගය.මාර්ගයේ බොහෝමයක් තැන් සංවර්ධනය වෙලා තියනවා.මේ කෙටි ප්‍රමාණය තමයි තියෙන්නේ.මේ මාර්ගය සංවර්ධනය කරාම ආයේ කාලයකට හොරගොඩ මාර්ග සංවර්ධනය කරන්න අවශ්‍ය වන එකක් නෑ.මේ පොඩි ප්‍රමාණය නිසා ඉතාම අසීරු තත්වයකට පත් වෙලා තියනවා.

ඒ අනුව තෙලිජ්ජවිල රාජකීය විද්‍යාලය අසලින් ආරම්භ වී හොරගොඩ නාපෙ හරහා මුස්ලිම් ගම්මානයට සම්බන්ධ විය හැකි මාර්ගයේ සංවර්ධනය කිරීමට ඉතිරිව ඇති මීටර් 102 ක කොටස සංවර්ධනය කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:21</u>**

ඇල්ගිරිය හොරගොඩ ප්‍රධාන මාර්ගයේ කැඩී තිබෙන පහත සඳහන් ස්ථාන පිළිසකර කරන ලෙස පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට දන්වා යැවීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

- සමන් මහතාගේ නිවස අසල
- සෙනවිරත්න මහතාගේ නිවස අසල
- රුහුණු මිහිර කඩය අසල

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී එන්.එන්.කේ මුණසිංහ මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

**<u>ගරු මන්ත්‍රී එන්.එන්.කේ මුණසිංහ මහතා</u>**

සභාපතිතුමනි,මේ මාර්ගයේ බස් එකක් ධාවනය වෙනවා.මාර්ගයේ පවතින අසීරුතාව හේතුවෙන් ඉදිරියේදී බස් රථය ධාවනය සිදු නොවීමටත් හැකියාව පවතිනවා.ඒ නිසා මෙය කඩිනමින් කරන්න සිදු කරන්න කියන ඉල්ලීම සිදුකරනවා.

**<u>ගරු මන්ත්‍රී ජේ.එල්.සුමිත් මහතා</u>**

සභාපතිතුමනි,පිටිවිලහේන මාර්ගය පටන්ගන්නා තැන බෝක්කුවක් තියනවා ඉතාම අනතුරුදායකයි.අනතුරු කිහිපයක්ම මාසයකට වෙනවා.රැට අනතුරක් බව පෙන්නුම් කරන්න සංඥාවක් සවි කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී ජී.ජී පාලිත කුමාර මහතා</u>**

සභාපතිතුමනි,මේ මාර්ගයේ කළුකඳ ළගින් එනකොට අර කිව්ව අවධානම් සහිත බෝක්කු 3ක් අපිට හමුවනවා.හොරගොඩ ඉපොල්ඔළුව හන්දියෙන් අවසන් වන ජයන්ත මහතාගේ නිවස අසල බෝක්කුව ඉතාම අවධානම්.බිබුලකඩේ පහු වුනාම තියන පාර පටුයි.දෙණියකඩේ සමන් මහතාගේ ගෙදර ළග වම් පැත්තේ ගැඹුරටම කඩාගෙන ගිහින් තියෙන්නේ.ඇල්ගිරිය හන්දියෙන් ඇතුළට යනකොට දකුණු පැත්තෙ ලොකු වලක් හැදිලා තියනවා.භාග්‍යගම ළගත් වෙල දෙපැත්තෙ ලොකු අවධානමක් තියනවා.මේ මාර්ගය මන්ත්‍රීතුමාගේ යෝජනාව අනුව පළාත් මාර්ගයක් ලෙස ලබා දෙන්න මං යෝජනා කරනවා.පළාත් සභාවේ ප්‍රතිපත්තියක් තියනවා ප්‍රාදේශීය සභාවේ නඩත්තු කරන පලාත් සභාවේ බස් දුවන පලාත් සභාවට අලුතින් පාරවල් එකතු කරගැනීමේ හැකියාව තියනවා.පලාත් සභාව එසේ පාරවල් එකතු කරගන්නකොට පලාත් සභාවේ පාරවල් මහා ආණ්ඩුවට එකතු කරගැනීමේ හැකියාව තියනවා.මේ පාර සභා මුදල් වලින් හරි නඩත්තු කරනවා නම් හරි වටිනවා.

ඒ අනුව ඇල්ගිරිය හොරගොඩ ප්‍රධාන මාර්ගයේ කැඩී තිබෙන ඉහත සඳහන් ස්ථාන පිළිසකර කරන ලෙස පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට දන්වා යැවීම මේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:22</u>**

මංවැල්ල හන්දියේ සිට නාගහ දක්වා පාර අලුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී එන්.එන්.කේ මුණසිංහ මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

**<u>ගරු මන්ත්‍රී ජේ.එල්.සුමිත් මහතා</u>**
සභාපතිතුමනි,ඇල්ගිරිය පිට්ටනිගෙදර නිවස අසල පාරත් එක්ක වෙලට අඩියක ප්‍රමාණයක්වත් නෑ.වාහනයක් එද්දි බයිසිකලයක්වත් නතර කරගන්න බැරි තත්වයක් තියෙන්නේ.ඒ සම්බන්ධව පරික්ෂණයක් පවත්වා සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්න කියලා මං ඉල්ලා සිටිනවා.

ඒ අනුව මංවැල්ල හන්දියේ සිට නාගහ දක්වා පාර අලුත්වැඩියා කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

## 6. යථා පරිදි කල් දී නොමැති යෝජනා.

**<u>යෝජනා අංක 6:1</u>**
2025.07.24 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා

ඒ අනුව 2025.07.24 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 6:2</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආවරණය වන පරිදි සියලු මාර්ග පද්ධතීන් කඩිනමින් නඩත්තු කිරීමේ හා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය හා ශක්‍යතා අධ්‍යයන වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**
තෝරාගත් මාර්ග ප්‍රමාණයක් කඩිනමින් සංවර්ධනය කරන්න යෝජනාවක් විදියට අපි දාල තියනවා පළාත් සභාවට.පළාත් සභාවෙන් මුදල් ප්‍රමාණයක් ලබාගත්තොත් සම්පූර්ණ කරන්න පුළුවන්.දැනට සභා අරමුදල් වලින් කරන්න යෝජනා ප්‍රමාණයක් දාගත්තනෙ.මුදල් ප්‍රමාණයක් ලබා දෙන්නම් කියලා ආණ්ඩුකාරතුමාගේ එකඟතාවයක් තියනවා.ඒ නිසා තමයි මේ පාරවල් ටික දා ගත්තෙ.

ඒ මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආවරණය වන පරිදි සියලු මාර්ග පද්ධතීන් කඩිනමින් නඩත්තු කිරීමේ හා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය හා ශක්‍යතා අධ්‍යයන වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 6:3</u>**
දම්පැල්ල ජයමාන්නවත්ත මාර්ගයේ මඩවල ඉවත්කර කාණු පද්ධතිය සකසා මාර්ගය සංවර්ධනය කිරීමේ ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**

මේ කොන්ක්‍රීට් පාරේ විශාල වතුර වලක් තියනවා.පැයුම් කාලේ වුනත් ඒ වතුර වල තියනවා.මුලින් සකස් කිරීමේදී සිදුවෙච්ච වැරැද්දක් තියෙන්නේ.පුද්ගලික ඉඩමක කාණුව බදින්න වෙන නිසා ප්‍රමාදයක් තිබුණා.ඒ අය දැන් කැමති වෙලා තියනවා අවශ්‍ය භූමි ප්‍රමාණය ඔප්පුවකින් ලබා දෙන්න.කඩිනමින් වැඩ අවසන් කරන්න පුළුවන් වේවි.

ඒ අනුව දම්පැල්ල ජයමාන්නවත්ත මාර්ගයේ මඩවල ඉවත්කර කාණු පද්ධතිය සකසා මාර්ගය සංවර්ධනය කිරීමේ ඇස්තමේන්තුව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:4</u>**

මාලිම්බඩ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා අංක MR/RP/3064 හා 2025.07.24 දිනැතිව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් එවා ඇති තක්සේරු වාර්තාව අනුව කඩ කාමර අංක 03 සහ 11 කඩකාමරය සඳහා වාර්තා කරන ලද වටිනාකම 2026 මැයි සිට 2029 අප්‍රේල් දක්වා අය කිරීමටත් අනෙකුත් සියලු කඩකාමර සඳහා වාර්තා කරන ලද මාසික කුලිය 2025 සැප්තැම්බර් මස සිට 2029 අප්‍රේල් දක්වා අය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා

ඒ අනුව මාලිම්බඩ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා අංක MR/RP/3064 හා 2025.07.24 දිනැතිව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් එවා ඇති තක්සේරු වාර්තාව අනුව කඩ කාමර අංක 03 සහ 11 කඩකාමරය සඳහා වාර්තා කරන ලද වටිනාකම 2026 මැයි සිට 2029 අප්‍රේල් දක්වා අය කිරීමටත් අනෙකුත් සියලු කඩකාමර සඳහා වාර්තා කරන ලද මාසික කුලිය 2025 සැප්තැම්බර් මස සිට 2029 අප්‍රේල් දක්වා අය කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා

කාරක සභාව මහා සභාවක් බවට පත් කිරීම

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

**<u>යෝජනා අංක 6:5</u>**

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මඟින් අනුමත වී ඇති තෙලිජ්ජවිල කොලේජ් විච් මාර්ගය කාණු පද්ධතිය සැකසීම හා කොන්ක්‍රීට් කිරීම වෙනුවට තෙලිජ්ජවිල කොලේජ් විච් මාර්ගය කැටගල් ඇල්ලීම ලෙස සංශෝධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී පාලිත කුමාර මහතා

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**

මේ යෝජනාව කොන්ක්‍රීට් කරන්න තමයි ඇවිල්ලා තිබුණේ.කොන්ක්‍රීට් කරන්න සමිති වලටත් දුන්නා මේ මුදලින් කරන්න කවුරුත් ගන්නෙ නෑ.කැටගල් වලින් කරන්න පුළුවන් කියලා කියනවා.සමිතිවලින් නෙවෙයි ටෙන්ඩර් කරලා කරන්න වෙන්නෙ ඒ නිසා ටිකක් කල් යයි.

ඒ අනුව පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මඟින් අනුමත වී ඇති තෙලිජ්ජවිල කොලේජ් විව් මාර්ගය කාණු පද්ධතිය සැකසීම හා කොන්ක්‍රීට් කිරීම වෙනුවට තෙලිජ්ජවිල කොලේජ් විව් මාර්ගය කැටගල් ඇල්ලීම ලෙස සංශෝධනය කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 6:6</u>**

දරුවන්ගේ අධ්‍යයන කටයුතු සඳහා නවීන පහසුකම් වලින් සපිරි විමර්ශන ඒකකයක් අප සභා පුස්තකාලයේ ආරම්භ කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය

**<u>ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා</u>**

සභාපතිතුමනි,මං මේ යෝජනාව කරන්න හේතුව මගේ දරුවා පුස්තකාලේ සාමාජිකයෙක්.එයාට අවශ්‍ය සමහර පොත් නෑ කියලා එයා යනවා මාතර බෝධි ආරක්ෂක සභාවේ පුස්තකාලයට.එහි උඩ ඉතා දියුණු මට්ටමේ විමර්ශන ඒකකය කියලා අංශයක් තියනවා දරුවන්ට අධ්‍යයන කටයුතු කරන්න සියළු පහසුකම් සහිතව.ඊයේ තෙලිජ්ජවිල පුස්තකාලයේ උපදේශන කමිටුව තිබුණා.මා ඒ සඳහා පත් කිරීම පිළිබඳවත් ස්තූතිවන්ත වෙනවා.මෙවැනි ඒකකයක් නිර්මාණය කිරීම සඳහා අපේ පුස්තකාලයේ සියලු පහසුකම් තියනවා.සභාවේ අරමුදල් මදි නම් මං ගමේ කිපදෙනෙක් සමඟ කතා කලා ඔවුන් ඒ වෙනුවෙන් දායක වෙන්නත් කැමති වුණා.ඒ වගේම අපේ මන්ත්‍රී දීමනාවෙනුත් කොටසක් යොදවන්න පුළුවන්.අවශ්‍ය උපාංග හා පහසුකම් සහිතව එවැනි ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා සියලු දෙනාගේ සහයෝගය ලබාදෙන මෙන් ඉල්ලා සිටිමින් නිහඬවනවා ස්තූතියි.

**<u>ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය</u>**

සභාපතිතුමනි,ඉතාම හොඳ අපට ඇස නොගැටුණු යෝජනාවක්.මං 2006 A/L කරද්දි කුමාරතුංග මුනිදාස පුස්තකාලය භාවිතා කරනවා.අද වන විට මාතර මහ නගර සභාවේ මුදල් හා ධානපතින්ගේ ප්‍රදාන හේතුවෙන් ඉතා දියුණු තත්වයකට පත්වෙලා Aශ්‍රේණියේ පුස්තකාලයක් බවට පත්වෙලා තියනවා. ගොඩනැගිල්ල හදලා තියනවා නම් සභාපතිතුමා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ කතා කරලා අත්පත් කරගෙන මේ විමර්ශන ඒකකය ස්ථාපිත කරන්න පුළුවන්නම් ඉතාම වටිනවා තෙලිජ්ජවිල දැනට B ශ්‍රේණියේ පුස්තකාලයක් බවට පත් වෙලා තියනවා.වර්තමානයේ දරුවන් ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය වෙත නැඹුරු වෙලා කියවීමෙන් ඈත් වෙලා තියනවා.වැඩිහිටියන් විදියට අපෙන් උද්දීපනයක් අවශ්‍යයි දරුවන්ගේ උපයෝගීතාවය වැඩි කරලා කියවීමේ අගය පිළිබඳ දැනුවත් කිරීමට.සියලු දෙනාගේ සහයෝගය මේ වෙනුවෙන් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිමින් නිහඬවනවා.ස්තූතියි.

ඒ අනුව දරුවන්ගේ අධ්‍යයන කටයුතු සඳහා නවීන පහසුකම් වලින් සපිරි විමර්ශන ඒකකයක් අප සභා පුස්තකාලයේ ආරම්භ කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:7</u>**

දැනට වසා දමා ඇති හොරගොඩ පොදු වෙළඳපොළ පෙර පැවති අඟහරුවාදා දිනටම නැවත ආරම්භ කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය

**<u>ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා</u>**

සභාපතිතුමනි,හොරගොඩ අවට ප්‍රදේශවාසීන්ට වෙළඳපොලක එකම අවස්ථාව තිබුණෙ හොරගොඩ පොළ.පෙර පැවති සභාවෙන් තීරණයක් ගත්තා සෙනසුරාදා පොලේ එළවළු වල ගුණාත්මක තත්වය පහල මට්ටමක තිබීම හේතුවෙන් අලුත් එලවළු ලබා ගැනීමේ අරමුණින් අඟහරුවාදා දිනට පොල පවත්වන්න.ඒක ප්‍රායෝගිකව සිදු වුණේ නෑ.වෙළෙන්දො පොලට ඒම නතර කලා පස්සෙ කොරෝනා උවදුර එක්ක සම්පූර්ණයෙන්ම වැහිලා ගියා.නගරයට යන්න බැරි ගමේ කෙනෙකුට අඩුවට එළවළු ටිකක් ගන්න තිබුණු අවස්ථාව නැති වුණා.දිනය වෙනස් කිරීම හේතුවෙන් පොල වැහුණා කියලා සභාවටත් අපකීර්තියක් තියනවා.ගම්මාන 4ක මිනිස්සුන්ට ආසන්න කඩ වලින් වැඩි මිලට එළවළු ගන්න සිද්ද වෙලා.ගොඩනැගිලි සඳහා සභාවේ මුදල් වියදම් කරලා තියනවා.සභාවක් විදියට මැදිහත් වෙලා නැවතත් අඟහරුවාදා දිනට පොළ පවත්වන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය</u>**

සභාපතිතුමනි,හොරගොඩ පොළ පැවති ස්ථානය හොරගොඩ කේන්ද්‍රීය ස්ථානයක්.ඒ අවට ඉඩම් බොහොමයක් අයිති සභාවට.පොල නොපැවැත්වීම හා කඩ කාමර පිළිබඳ පවතින නොසැලකිල්ල ඒ මුළු හන්දියම වැඩක් නැති තත්වයකට පත්වෙලා.2026 අයවැය යොජනාවටත් මං ඒක ඉදිරිපත් කලා.කඩ කාමර 2ක් විනාශ වෙලා තියනවා.ඒවට අපිම මැදිහත් විය යුතුයි.බිම් බදු ගෙවන අයට ඒ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන්න බැරි නිසා උදයසාන්ත මන්ත්‍රීතුමාගේ යෝජනාව එක්කම මෙහි ස්ථානීය පරීක්ෂණයක් සිද්ද කරලා පොල සංකීර්ණය යථා තත්වයට පත් කරන්න කටයුතු කරමු කියන ඉල්ලීම කරනවා.

**<u>ගරු මන්ත්‍රී ජී.ජී පාලිත කුමාර මහතා</u>**

සභාපතිතුමණි, හොරගොඩ පොළ ගැන කතා කරද්දී ගැටලුවත් එක්කම තමයි කතා කරන්න ඕන ඉරිදට තෙලිජ්ජවිලට ගේන එළවළු සඳුදට මාලිම්බඩට ගේනවා ඉතුරු ටික අඟහරුවාදට හොරගොඩ පොළට අරගෙන යනකොට හොරගොඩ ජනතාවගේ යම් ප්‍රශ්නයක් හිත් වල ඇති වුණා ඒ නිසා අපිට සිදුවුනා දෙනිපිටිය පැත්තට ගිහිල්ලා හොරගොඩ පොළේ අලුතින් වෙළෙන්දෝ ගෙනල්ලා පොළ පවත්වන්න.නමුත් සාර්ථක වුණේ නෑ.ඒ ප්‍රදේශයේ ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇතිවුණොත් නැවත පොළ ආරම්භ කරන්න පුලුවන්.ඒ වගේම තමයි දැන් ඇතිවෙලා තිබෙන විශාල එළවළු කඩ නිසා මිනිසුන් විශාල වශයෙන් ඒ වෙත ඇදී යනවා.පොළේ බඩු මිල වැඩී කියන කතාවත් මිනිසුන් අතර තියනවා.කෙසේ වෙතත් හොරගොඩ පොළ ආරම්භ කරන්න කටයුතු කරමු කියන ඉල්ලීම කරනවා.හොරගොඩ සමූපකාර ප්‍රාදේශීය තියෙන්නෙ අපේ භූමියක බදු අය කර ගැනීමේදි එයින් මුදල් එනවද කියන කාරණාව මම දන්නෑ. ලිඳ ළඟ ඉදලා සිරිවර්ධන මහත්තයගෙ ඉඩම දක්වාත් හොරගොඩ ස්කොලෙ ළඟ ඉදලත් උඩ ටිකත් අයිතිය තියෙන්නෙ අපිට අක්කර පහක පමණ විශාල

භූමියක් තියනවා. මේවා හදුනාගන්න සර්වෝද සමිතියට ඉල්ලන නිසා එතනිනුත් ආදායමක් ගන්න පුලුවන්.

**ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා**
දෛනිකව භාණ්ඩ මිලදී ගැනීමත් එළවළු කඩවලට ජනතාව ඇදීයාමත් නිසා පොළවල්වල සාර්ථකභාවය අඩාලවෙලා තියනවා පොළ ආරම්භ කරනවානම් සකාහා අධ්‍යයන වාර්තාවක් අරගෙන සාර්ථකද කියලා බලල තමයි තීන්දුවකට යන්න වෙන්නෙ එසේ නොමැති වුනොත් ඒ භූමිය වෙනත් කටයුත්තක් වෙනුවෙන් ඵලදායීව යොදාගන්න අවධානය යොමු කරමු.

ඒ අනුව දැනට වසා දමා ඇති හොරගොඩ පොදු වෙළඳපොළ සකාහා අධ්‍යනයක් සිදු කර ඒ අනුව කටයුතු කිරීම සඳහා කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 6:8**
හොරගොඩ මුස්ලිම් ගම්මානය, ලිබර්ටි ටෙරන්ස් වෙන්දේසි ඉඩම වැනි කුඩා ඉඩම් වල පදිංචි කරුවන්ගේ කැලිකසල එකතු කිරීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය

**ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා**
සභාපතිතුමණි, ඉතා පාරිසරික ගැටලුවක් බවට පත්වෙලා තියනවා මුස්ලිම් ගම්මානය ආශ්‍රිතව හා පොඩි ඉඩම් වල ජීවත් වන ජනතාව නිසා හොරගොඩ වැල්ලානෙන් ආරම්භ වන හොරගොඩ නාපෙ ඇලත් එකක්ම නිල්වලාවට කඩුකන්න හරහා ඇල මාර්ගයට තමයි හොරගොඩ ප්‍රදේශයේ වැඩිම කුණු බැහැර කරන්නෙ.වී වගාකරන ගොවීන්ට කුඹුරට බහින්න බැරිවෙලා තියනවා.මේකට වැඩ පිළිවෙලක් හදලා ජනතාව දැනුවත් කිරීම සිදු කළ යුතුයි.මුස්ලිම් පාසල,පල්ලිය,ග්‍රාම නිලධාරී ඇතුළු රාජ්‍ය නිලධාරීන් හා ආයතන මැදිහත් කරගෙන ජනතාව දැනුවත් කිරීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කරමු.ඒ ප්‍රදේශයේ කසල එකතු කිරීම සිදු නොවන නිසා දැඩි අර්බුධයකට මුහුණ දීලා තියනවා ඒ නිසා කඩිනමින් මැදිහත්වීම සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා**
වැල්ලාන ප්‍රදේශයෙන් කුඹුරුවල පවතින පාරසරික තත්වය පිළිබඳව අදහස් ඇවිල්ලා තියනවා.ඉදිරියේදී ට්‍රැක්ටර් රියදුරෙක් බඳවා ගත්තම මුස්ලිම් ගම්මානය ඉලක්ක කරලා ක්‍රියාත්මක කරන්න පුළුවන්.කසල ලබා ගන්නා අවස්ථාවේදීම කසල වෙන් කර ලබා දීම පිළිබඳව දැනුවත් කිරීම සිදු කරන්න අවශ්‍යයි.

ඒ අනුව හොරගොඩ මුස්ලිම් ගම්මානය, ලිබර්ටි ටෙරන්ස් වෙන්දේසි ඉඩම වැනි කුඩා ඉඩම් වල පදිංචි කරුවන්ගේ කැලි කසල එකතු කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 6:9**
කොලේජ් විව් මාර්ගය කැටගල් අල්ලා සංවර්ධනය කිරීම සඳහා ඉදිරිපත් කරන ලද රු.1,977,722.89 ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා

ඒ අනුව කොලේජ් විව් මාර්ගය කැටගල් අල්ලා සංවර්ධනය කිරීම සඳහා ඉදිරිපත් කරන ලද රු.1,977,722.89 ක ඇස්තමේන්තුව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 6:10**

Clean Sri Lanka ජාතික වැඩසටහන යටතේ මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු මාර්ගයන් පිරිසිදු කිරීමට අදාළව රු.125,000.00ක ඇස්තමේන්තු මුදල හා අදාළ ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා

ඒ අනුව Clean Sri Lanka ජාතික වැඩසටහන යටතේ මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු මාර්ගයන් පිරිසිදු කිරීමට අදාළව රු.125,000.00ක ඇස්තමේන්තු මුදල හා අදාළ ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාව අනුමත කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 6:11**

ලෝක ළමා දිනය නිමිති කරගනිමින් බල ප්‍රදේශයේ සියලුම පෙර පාසල් නියෝජනය වන පරිදි දරුවන් 700ක් සඳහා වින්දනාත්මක අධ්‍යාපනික වැඩසටහනක් පැවැත්වීම වෙනුවෙන් පහත ඇස්තමේන්තුව ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා

ලෝක ළමා දිනය නිමිති කර ගනිමින් පෙර පාසල් දරුවන් සඳහා වින්දනාත්මක අධ්‍යාපනික වැඩසටහනක් පැවැත්වීම.

උක්ත කරුණට අදාලව මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියලු පෙර පාසල් දරුවන් සඳහා ලෝක ළමා දින වැඩසටහන සඳහා දළ වියදම් ඇස්තමේන්තුව අනුමැතියට අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා මේ සමඟ ඉදිරිපත් කරමි. (මේ සඳහා බල ප්‍රදේශයේ සියලුම පෙර පාසල් දරුවන් 700 ක් සිටින අතර ඒ සියලු දරුවන් මේ සඳහා තෝරා ගන්නා ලදි. මෙහිදී කිසිදු තෝරා ගැනීමක් සිදු නොකරණ ලද අතර තිරසර සංවර්ධන අරමුණ වල ඇතුලත් " සියලු දෙනාට සමාන අධ්‍යාපන අවස්ථා උදා කරදීම" අරමුණු කර ගනිමින් මේ සඳහා බල ප්‍රදේශයේ සියලුම දරුවන් සම්බන්ධ කර ගනු ලැබේ. මන්ද මෙය අධ්‍යාපනික තේමාවන්ද ඇතුලත් වින්දනාත්මක වැඩ සටහනක් වන බැවිනි. )

| වියදම් කරනු ලබන කාරණය | වියදම් දරණු ලබන මුදල (රු) |
|---|---|
| 01.දරුවන් 700 ක් සඳහා තාගය ලබා දිම | |

| | | | |
|---|---|---|---|
| I. | පාට පැන්සල් පෙට්ටි 700ක් මිලදී ගැනීම සඳහා | රු.250x700 | රු.175,000.00 |
| II. | රුල් නැති පොත් පිටු 80 පොත් 02 බැගින් පොත් 1400 ක් මිලදී ගැනීම | රු.65x1400 | රු.91,000.00 |
| III. | කෑම පෙට්ටි 700 ක් (නිසි ප්‍රමිතිය සහිත) | රු.270x700 | රු.189,000.00 |
| | | | = රු.455,000.00 |

02. දරුවන් 700 ක් සඳහා සංග්‍රහ වියදම්

| | | | |
|---|---|---|---|
| i. | කට්ලට් 700 ක් සඳහා | රු.35x700 | = රු.24,500.00 |
| ii. | කේක් 28 kg | රු.1000 x 28 | = රු.28,000.00 |
| i. | සැන්විච් පාන් පෙත්තක් | රු.25 x 700 | = රු.24,500.00 |
| ii. | කිරි පැකට් 700ක් සඳහා | රු.90 x 700 | = රු.63,000.00 |
| | | | = රු.133,000.00 |

| | |
|---|---|
| 03.ශබ්ද විකාශන යන්ත්‍ර හා මයික්‍රෆෝන කුලියට ගැනීම සඳහා | = රු.35,000.00 |
| 04.ස්ටේජ් සමඟ හට් සඳහා | = රු.35,000.00 |
| එකතුව | = **රු.658,000.00** |

ඒ අනුව ලෝක ළමා දිනය නිමිති කරගනිමින් බල ප්‍රදේශයේ සියලුම පෙර පාසල් නියෝජනය වන පරිදි දරුවන් 700ක් සඳහා වින්දනාත්මක අධ්‍යාපනික වැඩසටහනක් පැවැත්වීම වෙනුවෙන් ඉහත ඇස්තමේන්තුව ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

## 7) කාරක සභා වාර්තා /කමිටු වාර්තා අනුමත කිරීම. - නැත

## 8) ආදායම් වියදම් පිළිබඳ වාර්තා සලකා බැලීම

.

## 9) වෙනත් කරුණු - නැත

සභාපතිතුමාගේ ස්තූති කථාවෙන් පසු ප.ව 1.00 ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදී.

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව